ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2015/09/30 |

## 2015 සැප්තැම්බර් මස උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ (කො.පා.මි.ද.) (2006/07=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය, 2015 සැප්තැම්බර් මාසයේ දී ලක්ෂ්‍යමය පදනම මත පසුගිය මාසයේ වාර්තා කළ සියයට -0.2 හි සිට සියයට -0.3 දක්වා පහළ ගියේය. වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2015 අගෝස්තු මස පැවැති සියයට 1.0 හි සිට 2015 සැප්තැම්බර් මාසයේ දී සියයට 0.7 දක්වා පහළ වැටිණි.



කො.පා.මි.දර්ශකය 2015 අගෝස්තු මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා සියයට 0.3 කින් පහළ ගියේය. කො.පා.මි. දර්ශකයේ මෙම පහළ යෑම කෙරෙහි ආහාර කාණ්ඩයෙහි අයිතමයන්හි මිල ගණන් පහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. සමහර එළවළු වර්ග, අමු මිරිස්, මත්ස්‍ය වර්ග, බිත්තර, සහල්, රතු ළූනු, පොල්තෙල් සහ පොල් ආදියෙහි මිල ගණන් 2015 සැප්තැම්බර් මාසයේ දී පහළ වැටිණි. කෙසේ වුවද, කුකුළු මස් , හරක් මස්, කරවල, උම්බලකඩ, සමහර පළතුරු වර්ග, ලොකු ළූනු, දෙහි සහ සීනි ආදියෙහි මිල ගණන් මෙම මාසය තුළ ඉහළ නැගිණි. ආහාර නොවන කාණ්ඩය තුළ, රෙදිපිළි හා පාවහන්; ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ ඒකක නඩත්තුව; සහ විනෝදාත්මක හා සංස්කෘතික යන උප කාණ්ඩවල මිල ගණන් ඉහළ ගියේය. අධ්‍යාපන; නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන; සෞඛ්‍ය; ප්‍රවාහන; සන්නිවේදන; විවිධ භාණ්ඩ හා සේවා යන උප කාණ්ඩ මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.